# පරිවෙණ සංකල්පයේ කූටප්‍රාප්තිය සනිටුහන් කරන අෂ්ටමූලායතන පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

පූජ්‍ය උල්පතගම අමිතරතන හිමි
පූජ්‍ය ගල්වැවේ විමලඛන්ති හිමි

ශ්‍රී ලංකාවේ බෞද්ධ අධ්‍යාපන ආයතන පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ දී එහි ආභාසය බුදුරජාණන් වහන්සේගේ ධර්මාන යුගය දක්වා ම ඈතට දිව යන බව දක්නට ලැබේ. බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ද පුද්ගලයාගේ ඒකාන්ත අභිවෘද්ධිය සලසනු වස් සකස් වුණු ප්‍රතිපත්ති මාලාවකි. නූතනයේ විවිධ අධ්‍යාපනඥයන් හඳුන්වා දුන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවලට සාපේක්ෂ ව බෞද්ධ අධ්‍යාපනය උසස් ස්ථානයක වැජඹෙන බව ඉදුරා ම කිව හැකි ය. අධ්‍යාපනය යන්න විමසීමේ දී “සික්ඛා" යන පදය බුදු සමයෙහි අධ්‍යාපනයට සමාන බව පෙනේ. එහි තේරුම “හික්මීම" යනු යි. මෙය සදාචාරාත්මක පුහුණුවකි. (Moral practice) සදාචාරාත්මක ශික්ෂණයකි. (Moral Discipline) මේ හික්මීමට අදාළ ප්‍රතිපත්ති මාලාව ශික්ෂා පද යන්නෙන් අර්ථවත් වේ. මෙම ප්‍රතිපත්ති මාලාව නිවන දක්වා ම (යාව නිබ්බානං) අවශ්‍ය වේ. මෙය සේඛ පටිපදා යනුවෙන් හඳුන්වා ඇත. මෙහි දී සාකච්ඡා කළ යුතු තවත් පදයක් වන්නේ විනය යන්න යි. එහි තේරුම හික්මීම යන්න ය, සිත, කය, වචනය සංවර කර ගැනීම යන අදහස එහි විද්‍යමාන වේ.[1]

බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීමේ දී නොයෙක් පර්යාය ක්‍රමවේදයන් අනුගමනය කොට ඇති බව දැකගත හැකි වේ. ඒ බව **මජ්ඣිම නිකායේ** සච්චවිභංග සූත්‍රය පරිශීලනය කිරීම මගින් අනාවරණය වේ. “චතුන්නං අරියසච්චානං ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානීකම්මං" මෙම විවරණයට අනුව ඉගැන්වීමේ දී අනුගමනය කළ යුතු කරුණු හතක් දක්වා තිබේ.

01. ආචික්ඛනා - ඉදිරිපත් කරන දහම පිළිබඳ ව කරුණු වශයෙන් සංක්ෂිප්ත ව නාමික වශයෙන් කරන හඳුන්වා දීම.

02. දේසනා - මුලින් හඳුන්වා දුන් කරුණු පිළිබඳ විස්තරාත්මක ව පැහැදිලි කිරීම

03. පඤ්ඤපනා - අපේක්ෂිත දහම් කරුණු හඳුනා ගැනීමට අවකාශය සැලසීම

04. පට්ඨපනා - හඳුනාගත් කරුණු තහවුරු කිරීම

05. විවරණා - තහවුරු වූ දහම් කරුණු විස්තරාර්ථ වශයෙන් විවෘත කර දැක්වීම

06. විභජනා - එසේ විවරණය කළ ධර්මයෙහි විවිධ ප්‍රභේදයන් දැක්වීම

07. උත්තානිකම්මං - ශ්‍රාවකයාට හැම අතින් ම අනාවරණය වූ විවෘත වූ කරුණක් කොට දැක්වීම.[2]

මෙම කරුණු හත අනුගමනය කරනු ලබන නවකයෙකුට ශාස්ත්‍ර ගවේෂණයේ යෙදෙන්නෙකුට ඉතා පහසුවෙන් ප්‍රඥාව දියුණු කරගත හැකි ය. ඒ අනුව දැනගන්නා දෙය හුදු දැනුමකට සීමා නො වී එය පුද්ගලයාගේ ප්‍රඥාව අවදි කිරීමට මහත් රුකුලක් බවට පත් වේ. විශේෂයෙන් මෙම ඉගැන්වීම් ක්‍රමවේද සියල්ල මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයත් සමඟ මෙරට ද ස්ථාපනය වූ ආකාරයක් දැකගත හැකි වේ. ශ්‍රී ලංකාවේ ආරාම සම්ප්‍රදාය බිහිවීමේ මූලිකස්ථානය ලෙස මහා විහාරය හඳුනාගත හැකි ය. ඒ අනුව ථෙරවාද සම්ප්‍රදයේ මුල් ම ආගමික මධ්‍යස්ථානය මෙන් ම ආධ්‍යාපනික මධ්‍යස්ථානය ද මහා විහාරය ලෙස ඓතිහාසික කරුණු මගින් අනාවරණය වේ.

මහා විහාර සම්ප්‍රදයට පසු ව ගොඩ නැගුණා වූ විහාර සම්ප්‍රදය වන්නේ අභයගිරි සම්ප්‍රදාය යි. මහා විහාර සම්ප්‍රදායේ එවකට භික්ෂූන් වහන්සේලා විසින් අනුගමනය කරන ලද්දේ ථෙරවාදී සම්ප්‍රදාය යි. එහෙත් අභයගිරි ආරාම සම්ප්‍රදය නිර්මාණය වී ටික කලක් ගත වන විට එහි ඇති වූ අර්බුදකාරී තත්වයන් පදනම් කොට ගෙන මහා විහාරික භික්ෂූන් වහන්සේලා අභයගිරික භික්ෂූන් වහන්සේලා ප්‍රතික්ෂේප කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආරාම දෙකෙහි ම පැවැති එකම ථෙරවාදී සම්ප්‍රදයය ථෙරවාද හා මහායාන යන කොටස් දෙකක් වශයෙන් බෙදීමට ලක් විය. “මේ විහාරස්ථානය අධ්‍යාපන ආයතනයක් වශයෙන් සංවර්ධනය වීමට මහින්දගමනය සිට සියවස් දෙක තුනක්වත් ගත වෙන්නට ඇති බව පිළිගත යුතු ය. කෙසේ වුව ද ක්‍රි.ව. 5 වැනි සියවස පමණ වන විට නම් ජාත්‍යන්තර වශයෙන් පවා ප්‍රකට ව පැවැති බව නිසැක ය. මහා විහාරය යනු එක ම ගොඩනැගිල්ලක් නො වේ. එය ගොඩනැගිලි සමූහයක සංයුතියකි." ලෝකයේ විශාලතම බෞද්ධ ආයතනවලින් එකක් ලෙස එය දියුණු වූ බව මහාචාර්ය සෙනරත් පරණවිතාන පෙන්වා දෙයි. ලංකාවේ දී පිරිවෙණ (පා-පරිවෙණ) නමින් හැඳින්වෙන පළමු ගොඩනැගිල්ල නම් මේ තිස්සාරාමයේ ඉදි කරවන ලද ආවාස ගෘහයකි. කාලපාසාද පිරිවෙණ නමින් හඳුන්වා ඇති මේ තාවකාලික ගොඩනැගිල්ල ඉදි කරවන ලද්දේ දෙවන පැතිස් රජතුමා විසින් ය. දෙවන පැතිස් රජතුමා විසින් කරවන ලද වෙනත් ගොඩනැගිලි අතර මිහින්තලේ ගල් ලෙන් හැට අටක් ද වෙයි. මේ අතර මිහිඳු ගුහාව

නමින් හැඳින්වෙන ලෙන ප්‍රථම අධ්‍යාපන මධ්‍යස්ථානය විය හැකි බව ද ප්‍රථම ලාංකික භික්ෂු පිරිසට මෙහි දී ශාසනික අධ්‍යාපනය දෙන්නට ඇති බව ද ආචාර්ය යූ.ඩී ජයසේකර කල්පනා කරයි. පසු කලෙක මිහින්තලයට වඩා ප්‍රධාන තැන ගත්තේ අනුරාධපුර මහා විහාරය යි.[3]

මෙම තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ ඉදි කරන ලද ප්‍රථම ථෙරවාදී බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානය ලෙස මහා විහාරය හඳුනාගත හැකි ය. ලාංකික සිංහල බෞද්ධ සංස්කෘතියේත්, විශිෂ්ට බෞද්ධ චර්යා ධර්මයේත්, ඉන්දු ආර්ය අක්ෂර විද්‍යාව ගුරුකොටගත් සිංහල භාෂාවේත්, විවිධ බෞද්ධ කලාශිල්පයන්ගේත් මූලික පදනම කෝෂ්ඨාගාරය මහා විහාරය බව හඳුනාගත හැකි ය. පසු කාලීන ව විවිධ හේතු සාධක පදනම් කොට ගෙන නව අදහස් හා සංකල්ප මත එම අධ්‍යාපන ආයතන විහි දී ගිය ආකාරයක් අතීතයේ පටන් වර්තමානය දක්වා කරුණු අධ්‍යයනය කිරීමෙන් ගම්‍යමාන වේ.

අභයගිරි ආරාම සම්ප්‍රදාය නිර්මාණය වී ටික කලක් ගත වන විට එහි ඇති වූ අර්බුදකාරී තත්වයන් පදනම් කොට ගෙන මහා විහාරික භික්ෂූන් වහන්සේලා අභයගිරික භික්ෂූන් වහන්සේලා ප්‍රතික්ෂේප කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආරාම දෙකෙහි ම පැවැති එක ම ථෙරවාදී සම්ප්‍රදාය ථෙරවාද හා මහායාන යන කොටස් දෙකක් වශයෙන් බෙදීමට ලක් විය.

අභයගිරි ආරාම සම්ප්‍රදායේ ආරම්භය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමේ දී ක්‍රිස්තු පූර්ව පළමුවන ශත වර්ෂයේ වට්ටගාමණී අභය රජ පැමිණ පස් මසක් ගත වූ කල්හි තිස්ස නම් බ්‍රාහ්මණයෙක් තෙමේ බළ සෙනඟ සමග අනුරාධපුරයට පැමිණ රටේ සාමය බිඳ දමා නො කඩවා කැරලි ඇති කළේ ය. කැරලි කරුවෝ කෙතරම් බලවත් වූවෝ ද යත් කිසිවක් කර ගත නො හැකි වූ රජ සිරිත් පරිදි රුහුණට පලා ගියේ ය. මේ අවසරයෙන් දකුණු ඉන්දියාවෙන් පැමිණි දෙමළ පස් දෙනෙක් තුදුස් අවුරුදු සත් මසක් අනුරාධපුරයෙහි රජකම් කළහ. නැවතත් රුහුණෙහි සිට සේනාවක් කැටුව පැමිණ වළගම්බා රජ රාජ්‍යය අත් පත් කර ගත්තේ ය.[4] වළගම්බා රජු සතුරන්ගෙන් සැඟව ගත කරන අවධියේ එතුමන්ට උපකාර කරන ලද කුපික්කල විහාරයේ මහාතිස්ස තෙරුන්ට යුධ ජයග්‍රහණයෙන් පසු අභයගිරි විහාරය නිර්මාණය කොට පූජා කළ බව වංසකථා තොරතුරු මගින් අනවරණය වේ.

රාජ්‍ය ගෞරව සහිත අභයගිරි විහාර සංකීර්ණයේ වාසය කරන මහාතිස්ස තෙරුන් වහන්සේ කුල සංසට්ඨ ව වෙසෙති පසු ව උන් වහන්සේට දෙස් පවරා පබ්බාජනීය කර්මය ද සහිත ව සංඝ සමාජයෙන් නෙරපා දමන ලදි. මෙයට කිපුණු මහාතිස්ස තෙරුන් වහන්සේ ස්වකීය ප්‍රධාන ශිෂ්‍ය වූ බහළමස්සුතිස්සයන් මහාවිහාරයේ වැඩ සිටි භික්ෂූන් වහන්සේලා පන්සියයක් රැගෙන ගොස් මහාවිහාරයට ප්‍රතිවිරුද්ධ ව පක්ෂයක් ගොඩනගන ලදි. පසු ව අභයගිරික භික්ෂූන් වහන්සේලා කිසිවෙක් පොහොය විනය කර්මය සඳහා මහා විහාරයට නො ගියහ. මෙම ක්‍රියා කලාපය ශ්‍රී ලාංකීය භික්ෂු සංස්ථාවේ ප්‍රථම දෙදරායැම ලෙස සාසන ඉතිහාසයට එකතු වේ. මහා විහාරික භික්ෂූන් වහන්සේලා හා අභයගිරික භික්ෂූන්

වහන්සේලා අතර ඇති වූ මෙම අර්බුදකාරී තත්වයන් නිසා මුලින් අනුගමනය කළ පරමාරථ සාධනය කර ගැනීමට නො හැකි විය. ඒ නිසා ම මහා විහාරික භික්ෂූන් වහන්සේලාට ද මෙම තරඟකාරි ස්භාවයට මුහුණ දීමට සිදු වූ අතර, අභයගිරි භික්ෂූන් වහන්සේලා ලෞකික විෂයන් කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරන ලදි.

''මෙකල තවත් වැදගත් සිද්ධියක් වූයේ ය. එනම් ඉන්දියාවේ වජ්ජිපුත්තක ගණයට අයත් ධර්මරුචි නිකායේ භික්ෂූන් මෙහි පැමිණ අභයගිරි වාසීන් හා එකතු වීම ය. එතැන් පටන් අභයගිරිවාසීහු ධර්මරුචික නිකාය වශයෙන් ද මහා විහාරික පක්ෂය ථෙරීය නිකාය නමින් ද ප්‍රකට වූහ. නිකාය සංග්‍රහය නම් ග්‍රන්ථය එම සිද්ධිය මෙසේ විස්තර කරයි. එකල හෙතෙම ථෙරීය නිකායෙන් භින්නව අභයගිරි වෙහෙර ගොස් වසනුයේ වජ්ජිපුත්‍ර නිකායෙහි ධර්මරුචි නම් ආචාරින්ගේ ශිෂ්‍යයන් දඹදිව පල්ලාරාම නම් විහාරෙන් මෙරටට අවුත් තමා කරා වන් කල්හි ඔවුන්ගේ සමය කැමැති ව ඔවුන් හා එක්ව ධර්මරුචි නම් ආචාරී විධිය එතැන් පටන් අභයගිරිවාසීහු ධර්මරුචි නිකාය යි නම් වූහ.[5] මෙහි දක්නට ලැබෙන තොරතුරුවලට අනුව අභයගිරික භික්ෂූන් වහන්සේලා ථෙරවාදය අත්හැර මහායාන දර්ශනය ආරම්භ කළ තැන් පටන් මහායාන සම්ප්‍රදයට අදළ චාරිත්‍ර වාරිත්‍ර මෙම ආරාමයට සංක්‍රමණය වූ බව දැකගත හැකි වේ. මෙම තොරතුරුවලට අනුව අභයගිරි භික්ෂූන් වහන්සේගේ මෙම ක්‍රියා කලාපය හේතු කොට ගෙන ලංකාවේ නව අධ්‍යාපන ක්‍රමවේද බිහි වන්නට විය.

ක්‍රි.ව. හතරවැනි පස්වැනි සියවස් වන විට අනුරාධපුර මහා විහාරය ජාත්‍යන්තර කීර්තියට පත් වී පැවැති බව සිතීමට ඉඩ තිබේ. මහාවිහාරය, අභයගිරිය, මිහින්තලය වැනි ස්ථාන භික්ෂූන් වහන්සේලාගෙන් ගැවසීගත් තැන් විය. හතරවැනි ශතවර්ෂයේ ද්විතීයාර්ධයේ දී ලංකාවට පැමිණි ෆාහියන් නැමැති චීන භික්ෂූන් වහන්සේ තමන් පැමිණි කාලයේ මහා විහාරයේ භික්ෂූන් 3000ක් ද අභයගිරි විහාරයෙහි භික්ෂූන් 5000ක් ද නේවාසික ව විසූ බව සඳහන් කරති. එකල මුළු රටේ ම භික්ෂු සංඛ්‍යාව 60,000ක් පමණ වූ බව ද එතුමෝ සඳහන් කරති. මේ අතුරින් කිසියම් පිරිසක් තුන් සිංහලයේ විහාරස්ථාන මූලික කර ගෙන ධර්ම ශාස්ත්‍රීය සේවාවේ නිරත වන්නට ඇතැ යි සිතීම සාධාරණ ය.[6]

මෙ පරිද්දෙන් මහාවිහාරයෙන් ආරම්භ වූ ධර්ම ශාස්ත්‍රීය සේවාව කාලයක් ගත වන විට විවිධ සාධක පදනම් කොටගෙන ආයතනගත වූ අකාරයක් දැකගත හැකි ය. විශේෂයෙන් මහා විහාර හා අභයගිරි ගැටුම මේ සඳහා ප්‍රබල සාධකයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස අභයගිරි අධ්‍යාපන ආයතනයේ ආධ්‍යාත්මික සංවර්ධනයට එහා ගිය ලෞකික ජීවිතයේ විෂය පරාශයන් ද දියුණු වූ බවක් දැකගත හැකි වේ. තර්ක ශාස්ත්‍රය, ජ්‍යොතිෂය වැනි විෂයන් සඳහා ද අවස්ථාව බහුල ව තිබූ බව දක්නට ලැබේ. මෙම කාල පරිච්ඡේදය වන විට අභයගිරි අධ්‍යාපන ආයතනය මුල් කොටගෙන මූලායතන පවා බිහිවීමට අවශ්‍ය පරිසරය සකස් වී තිබුණි.

අනුරාධපුර රාජධානි සමයේ දී මූල නමින් දන්නා ලද ආයතන විශේෂයක්

ගැන වංසකතාවේ සඳහන් වේ. මූල නාමය යෙදූ පළමු විහාරය ඉදි කරන ලද්දේ ක්‍රි.පූ පළමු වැනි සියවසේ දී වළගම්බා රජු දවස ය. වළගම්බා සතුරන් නසා දෙවන වර ක්‍රි.පූ (89-77) රජවීමෙන් පසු අභයගිරි විහාරය ඇතුළු විහාර ඉදි කිරීමෙහි නිරත විය. ඒ මඟ ගත් ඇමතිවරු ද විහාර ඉදි කිරීමට යොමු වූහ. මූල ඇමති විසින් තම නමින් ඉදිකර වූ මූල විහාරය ද ඒ අතර වෙයි. උත්තිය නම් යෝධයා විසින් කරවන ලද දක්ඛිණ විහාරය ද, තිස්ස නම් ඇමතියා විසින් කරවන ලද උත්තර තිස්සාරාමය ද සමකාලීන සෙසු විහාර අතර වෙයි. වෝහාර තිස්ස රජතුමා (ක්‍රි.ව 209-231) ඡත්‍ර කර්ම කර වූ දගැබ් අට අතුරෙන් දක්ඛිණ මූල ද එකකි. මූල ඇමති විසින් එ නමින් ම ඉදි කර වූ විහාරස්ථානයේ කිසියම් වැගත්කමක් පසු කලෙක මූල නමින් ආරාම විශේෂයක් බිහි වීමට හේතු වූයේ ද යන්න විමසා බැලීමට යෝග්‍ය කරුණකි. කෙසේ වුව ද මූල යන පදය සමඟ යෙදී විවිධ නම්වලින් දන්නා ලද ආයතන අටක් ඓතිහාසික වශයෙන් වැදගත් වූ බව ප්‍රකට ය. මහා විහාරය වනසා දැමූ මහසෙන් (ක්‍රි.ව 274-301) රජු ජේතවනාරාමය කරවා දක්ඛිණාරාමවාසී භික්ෂූන්ට පූජා කිරීමෙන් පෙනීයන්නේ තෙවන සියවස පමණ වන විට ඒ විහාරය ඉතා වැදගත් තත්වයට පත් ව තිබුණු බව යි.[7] ඒ අනුව මෙම මූලායතන අතුරින් මූල හතරක් ම අභගිරියට අයත් ව තිබූ බව ටී.ජී කුලතුංග සඳහන් කරයි. මූලාශ්‍රයන්හි සඳහන් අයුරු මෙම ආයතන උතුරුළු (උතුරුළු-උතුරු, උත්තර) කපාරා (කප්පුර) මහනෙත්පා හා වාදු (වහදු) නම් වේ.[8]

ශාස්ත්‍රීය ලෝකයට විශිෂ්ට සේවාවක් සිදු කරන ලද අෂ්ට මූලායතන ආරම්භයේ දී අනුරාධපුරයෙහි වූ නමුත් අගනුවර වෙනස් වීමත් සමඟ ඒවා ද ඒ ඒ ස්ථානවල නිර්මාණය වූ බවක් දැකගත හැකි ය. පොදුවේ ගත් කළ මෙම ආයතන අට ශ්‍රී ලංකාවේ පැවැති උසස් අධ්‍යාපන ආයතන වන අතර ඒවායේ ධර්මධර හා විනයධර භික්ෂු පිරිසක් නිර්මාණය කලා සේ ම ලෞකික ජීවිතයට අදාළ බොහෝ විෂයක්ෂේත්‍රයන් දියුණු වූ බවක් දැකගත හැකි වේ.

01. සෙලන්තර මූලායතනය (ගලතුරු මූල)

02. උත්තරාළ්හ මූලායතනය (උතුරු මූල)

03. සරොග්‍රාම මූලායතනය (විල්ගම් මූල)

04. මහා නෙත්තප්පසාද මූලායතනය (මානෙත්පාමූල)

05. දක්ඛිණ මූලායතනය (දකුණුමූල)

06. කප්පුර මූලායතනය (කපුරුමූල)

07. සේනාපති මූලායතනය (සෙනරත්මූල)

08. වාහදීපක මූලායතනය (වහදුමූල) [9]

ප්‍රධාන විහාර ඇසුරු කොට ආයතන නමින් ඒ ඒ භික්ෂු පරපුරු සඳහා අෂ්ටායතන මූලස්ථාන ඇති කිරීම ද අනුරාධපුර කාලයේ දී ඇරඹී තිබෙන්නකි. මේ මූලස්ථාන අෂ්ටායතන ශාසනික ශාස්ත්‍රීය ව්‍යාපාර සම්බන්ධයෙන් හෝ අනික්

යම්කිසි කරුණක් නිමිති කරගෙන හෝ ප්‍රසිද්ධියට පත් ඒවා ය. සමහර විටක රජවරුන්ගේ විශේෂ සැලකිලි නිසා ඒ මූලස්ථාන නැඟී ආයේ වන නමුදු මූලස්ථාන වශයෙන් ගත් විට අටක් වේ. ඒවා පසු කලෙක අෂ්ටායතන නමින් ප්‍රසිද්ධියට පත් ව ඇත. ඒවා නම් ගලතුරුමූල, කපාරාමූල, උතුරුමූල, වාදුම්මූල, මහනෙත්පාමූල, දකුණුමූල, සෙනෙවිරත්මූල හා විල්ගම්මූල යනුවෙනි. මෙම මූලස්ථාන සඳහන් වන තැන් පිරික්සන විට කීපයක් ම එක ම කාලයක ගොඩනැඟී ආ සැටි දක්නට පුළුවනි. මේවා කවර කවර නිකායට අයත් ද යනු හරි හැටි කිව නො හැකි යි. එහෙත් කපාර, උතුරලු, වාදු හා මහනෙත්පාමූල නම් ඒවා අභයගිරියට සම්බන්ධ ව පැවැති සැටි පෙනේ. ඒ වනාහි අභයගිරියට රාජපරපුරකගේ විශේෂ සැලකිලි ලැබුණු යුගයකි. අනුරාධපුර අවසාන කාලයෙහි විසූ පස්වන මිහිඳු (ක්‍රි.ව.1026-1042) රජුත් මේ මූලස්ථාන හතර මහත් හරසරින් රැකගත් හැටි ඒ රජුගේ සෙල්ලිපියකිනුදු පැහැදිලි වේ. දකුණුමූල හා සෙනෙවිරත්මූල ජේතවන නිකායට අයත් අයත් බව බොහෝ දෙනාගේ කල්පනාව යි. දකුණු වෙහෙර ජේතවනයට හෙයින් දකුණුමූල එහි වූ බව ද සලකනු ලැබේ. පොත්ථසාථ ඇමති විසින් දෙව්රම් වෙහෙර කරන ලද සේනාපතිරාජ පිරිවෙණ මුල් කොට සෙනෙවිරත්මූල ඇති වූ වග සලකන හෙයින් එය ද ජේතවන නිකායට අයත්කොට පෙන්වනු ලැබේ. අනිත් ගලතුරුමූල හා විල්ගම්මූල කවර නිකායකට අයත් ද යනු පැහැදිලි නැත. ගලතුරුමූල වනසෙනස්නෙහි (අරඤ්ඤයතනයෙහි) ඇති කළ බව ප්‍රසිද්ධ ය. පොළොන්නරු කාලය වන විට අරඤ්ඤායතනයෙහි වැඩසිටියෝ මහාවිහාර භික්ෂූහු ය. පොළොන්නරු ශාසන ශෝධනයෙහි මුල් වූ කාශ්‍යප මාහිමි දිඹුලාගල වන සෙනස්නෙහි වැඩසිටි බව ප්‍රකට ය. මේ නිසා ගලතුරුමූල (සෙලන්තරමූල) මහා විහාරයේ ආයතනයක් බව පෙනේ. විලගම්මූල පොළොන්නරුවේ ජේතවන විහාරයෙහි පිහිටි බව **අභිධානප්පදීපිකාවේ** සඳහන් වේ. **නිකාය සංග්‍රහයේ** පෙනෙන සාහිත්‍ය විල්ගමූල හිමි ද මෙහි වැඩවිසූ බව සිතිය හැකි ය. මෙසේ මේ ආයතන අට ම පොළොන්නරු කාලයට පෙර අනුරාධපුර ශාසන ඉතිහාසයට ඇතුළත් ව පැවැති බව සැලකුව මනා ය.[10]

## 01. සෙලන්තර මූලායතනය (ගලතුරු මූල)

ගලතුරුමූල නමින් ප්‍රසිද්ධියට පත් වූයේ මෙම ආයතනය යි. දෙවන දඨොපතිස්ස (ක්‍රි.ව. 662-71) රජු කළ ආරාමයක් මේ නමින් පසු ව ප්‍රසිද්ධ ආයතනයක් බවට පත් විය. සේලාන්තරයෙන් පැමිණි මහ සඟන එම ආරාමයේ විසූ අතර පළමු සංඝ සමූහය වැඩ විසූ ආරාම හෙයින් සේලන්තර ආරාම නාමයෙන් ප්‍රසිද්ධියට පත් විය. එකී මහ සඟනේ මූල පදවිය අයතැන් නමින් හැඳින් විය. මෙය කර වූ දඨොපතිස්ස, සිලාදාඨ, හත්ථදාඨ යන නම්වලින් ද ප්‍රකට විය. පසු කාලීන ව මෙහි මූල පදවිය දැරූ තෙරුන් වහන්සේගේ ගෞරවනාමය වූයේ ගලතුරුමූල යන්න යි.[11] මෙහි වාසය කළ අග්‍රගණ්‍ය ශ්‍රේෂ්ඨ පඬිවරුන් ලෙස ගලතුරුමූල නන්ද, ගලතුරුමූල සීල, ගලතුරුමූල මේධංකර, ගලතුරුමූල මෛත්‍රීය යන තෙරවරුන් හඳුන්වාදිය හැකි ය. සෙලන්තරමූලයේ මහතෙරවරුන් තෝරාපත් කර ගැනීමේ දී අනුගමනය කොට ඇති ක්‍රමවේදය දෙවියන්ගේ කැමැත්ත මත රඳා පවතී. එය "සෙලන්නතර මූලයේ

ප්‍රධාන තෙරුන් තෝරාගන්නේ අමුතු පිළිවෙළකට ය. දෙවොලක රාත්‍රියේ කෙනෙකු වාසය කරවා දෙවියන් විසින් අනුමත කෙරුණු භික්ෂූන් වහන්සේ නමක් සෙලන්තර සමූහයේ ප්‍රධානත්වයට පත් කළ බව[12] දක්වා තිබේ.

ගලතුරුමූල නන්ද හිමියන් මහ පැරකුම්බා රජු විසින් ශාසන ශෝධන කාර්ය සඳහා කැඳවන ලද අතර මහා කාශ්‍යප හිමිට සහාය වෙමින් ක්‍රියා කළ අයෙකි.[13] ගලතුරුමූල නීල තෙරණුවෝ දෙවන පැරකුම්බා රජුගේ ආචාර්යවරයා විය. ගලතුරුමූල මේධංකර ලෙස මහතෙරවරුන් දෙනමක් වූ අතර ඉන් එක් අයෙකු ශ්‍රී ශාරිපුත්‍ර සංඝරාජයාණන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකි. උන් වහන්සේලා දඹදෙණි කතිකාවත පිළියෙල කිරීමට ද තුන්වන වීරබාහු රජුට ද ශාසන ශෝධනයට ද උපකාරී වී ඇත. ගලතුරුමූල මෛත්‍රී හිමි දෙවන විජයබාහු රජුගේ ශාසනශෝධනයේ දී ක්‍රියා කරමින් ධම්මකිත්ති මහා සාමිට සහාය විය. ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ගලතුරුමූල මහා ස්වාමි මූලපදවිය දරූ අන්තිම මහතෙරුන් යැයි සූර්ය ශතකයේ සඳහන් ය.[14] මෙහි දක්නට ලැබෙන තොරතුරුවලට අනුව 15 වන සියවසේ අග භාගයේ සෙලන්තර මූලය මහත් ප්‍රසිද්ධියට පත් අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගත හැකි ය. එයින් පඬිවරු විශාල ප්‍රමාණයක් මේ කාල පරිච්ඡේදය වන විට නිර්මාණය කොට තිබූ බව දක්නට ලැබේ.

## 02. උත්තරාළ්හ මූලායතනය (උතුරු මූල)

උත්තරෝල, උත්තරාළ්හක, උතුරල යන නම්වලින් ද හඳුන්වන අතර අභයගිරි විහාරයට අයත් සුප්‍රසිද්ධ පිරිවෙණක් ලෙස සැලකේ. පූජාවලියේ වාර්තාවට අනුව උත්තරමූලය මුලින් ම කරවන ලද්දේ මානවම්ම රජුට (ක්‍රි.ව 689-698) ආසන්න කාලයේ ය.[15] කපාරාමූල, වහදූමූල, මහනෙත්පාමූල, යන අභයගිරියට අයත් මූල අතුරින් ඉතා වැදගත් ආයතනය උත්තරමූල බව පොළොන්නරු වේලෙක්කාර ලිපියේ දක්වා තිබේ. "මූලස්ථානමාහිය අභයගිරි විහාරත්තු අග්‍රායතන නාම උත්තෝරුල්මුලෛයිල්." [16] මෙම සඳහනට අනුව උත්තරමූලයට ප්‍රමුඛස්ථානය ලැබෙන්නට ඇත්තේ මුල් භික්ෂු පරම්පරාව සිටීම සහ දළදාව වැඩ සිටීම හේතුවෙන් ප්‍රධාන ආගමික ස්ථානයේ භාරකාරත්වය ඊට ලැබීම නිසා විය හැකි බව ටී. ජී. කුලතුංගගේ අදහස වේ. "දළදාව මෙරටට ගෙනෙන අවධියේ අභයගිරිය මූලවලට බෙදී තිබූ බවට සාක්ෂ්‍ය නොමැති අතර එය එහි සිටි එක ම කණ්ඩායම එනම් පැරණිතම කණ්ඩායමේ භාරකාරත්වයට පත් වූ බව පෙනේ. එසේ දළදාවේ භාරකාරත්වය ලැබූ කණ්ඩායම පැරණිතම කණ්ඩායම සේ ගත් කල්හි වේලෙක්කාර ලිපියේත් "දළදා සිරිතේ උත්තරමූල අයතැන් හා කරඬුව අස් කඩා දළදා සාමීන් එළියට වඩා උතුරුමූල අයතැන් සිටි තැන් හා බොහෝ දෙනාට දක්වනු ඉසා" යන සඳහන් ඊට නිදසුනකි. මේ අනුව උත්තර විහාරීය සමූහය එහි පැරණිතම කණ්ඩායම බව මනාව පැහැදිලි වේ."[17]

උත්තරමූලයේ ආරම්භය සම්බන්ධයෙන් මත කිහිපයක් දක්නට ලැබේ. "උතුරොළ පිරිවෙණ කර වූ ලෙරියන් දළමියි උතුරළු මූල ගැන සීගිරි කැටපත්

පවුරේ ලියා ඇත්තේ ය. මූලය කර වූ නිර්මාතෘවරයාගේ නම ලෙරියන් ය. හේ සීගිරි චාරිකාවේ යෙදෙමින් මෙසේ ලියා තැබීය. උතුරොළ, උත්තරාළ්හක, උත්තරෝළ, යනුදු එකම ආයතනය යි. මෙය අයත් වනුයේ බගිරිනකයට ය. පූජාවලී වාර්තාවට අනුව මානවම්ම රජුට (ක්‍රි.ව 689-698) ආසන්න කාලයක උත්තරමූල වෙහෙර කරවා ඇත. යන්ත්‍ර, මන්ත්‍ර ගුරුකම්, ස්තෝත්‍ර ගැන විශ්වාස කළ රජු තම රාජෝෘද්‍යයේ අවසනැ දැස් අන්ධ වූවට පසු රාජ්‍ය අතහැර අභයගිරියෙහි දී ප්‍රව්‍රජ්‍යාවට පත් වූයේ රාජ්‍යයට පත් මානක නම් රජුගේ සොහොයුරා උත්තරෝළ විහාරය කරවා රාජකීය මානවම්ම හිමියනට පිදී ය. දළද වහන්සේගේ අයිතිය ඒ නිසා අභයගිරි උත්තරමූලයට අයත් විය. පිහිටි ග්‍රාම පියසේ නමින් උත්තරමූල නම් විය."[18] වූ බව සඳහන් වේ.

## 03. සරොග්‍රාම මූලායතනය (විල්ගම් මූල)

මහා පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව. 1153-1186) විසින් පිහිට වූ යුද කඳවුරක් පිහිටි මහවැලි ගඟේ තොටුපලක් අසල වූ ගම් පියසෙහි පිහිටා තිබූ නිසාවෙන් සරොග්‍රාම ලෙස හඳුන්වයි.[19] මෙම ආයතනය විල්ගම්මූල ලෙස ද හඳුන්වනු ලබයි. **අභිධානප්පදීපිකා** පාලි නිඝණ්ඩු කෝෂ ග්‍රන්ථයෙහි කර්තෘ මොග්ගල්ලාන මහාසාමි මෙම මූලයෙහි ප්‍රධානත්වය දරූහ. ඉන් පසුව විල්ගම්මුල මහා ස්ථවිරයන් ද මෙහි මූලායතානාධිපති ධුරයට පත් ව ධර්ම ශාස්ත්‍රීය ලෝකය අවධි කිරීමට විශාල සේවාවක් ඉටු කරන ලදි. එම ආයතනයේ වැඩවාසය කරමින් **සිංහල බෝධිවංශය, අනාගතවංස දේශනාව, සූර්යස්තෝත්‍ර ශතක සන්නය** වැනි ග්‍රන්ථ රචනා කිරීම සිදු කරන ලදි. ලෝකේශ්වරගේ (ක්‍රි.ව. 1210) **කොට්ටන්ගේ ලිපියෙහි**[1] 'විල්ගම්මුල වපසිනා ආයතන්' යනුවෙන් මෙම මූලය පිළිබඳ ව සඳහන් වේ. එම අදහසට අනුව ඉඩමක් පිළිබඳ ආරවුලක් ආයතනාධිපති ලවා විසඳවාගත යුතු බව එහි දක් වේ. අභය නම් තෙර නමක් තම පමුණුවක දේපළක් මහ සඟනට පිදූ බව ද වාර්තා වේ.[20]

මෙම විල්ගම්මූල ආයතනය සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ගැටලු සහගත තත්වයක් ඇති බව දක්නට ලැබේ. පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය යන කෘතියෙහි ඒ සඳහා කරුණු කිහිපයක් දක්වා තිබේ. "විල්ගම්මුල ආරම්භය පිළිබඳ ව කිසිදු තොරතුරක් නො ලැබෙයි. පොළොන්නරු යුගය ආරම්භ වන විට අෂ්ටායතන සම්පූර්ණයෙන් පැවැති හෙයින් මෙම ආයතනය ද අනුරාධපුර යුගයේ ආරම්භ වන්නට ඇතැ යි සිතිය හැකි ය. විල්ගම්මූල කවර ස්ථානයක පිහිටි ආයතනයක් ද යන්න පිළිබඳ මතභේද පවතී. දෙතිස් පලරුහ රෝපණය කළ ස්ථාන අතර සේරුවිල සමීපයේ නයින්ගේ විල්ගම් වෙහෙර ද එකක් හැටියට සිංහල බෝධිවංශය දක්වා තිබේ. මේ අනුව ත්‍රිකුණාමලයේ පෙරියකුලම්හි තිබෙන විල්ගම්වෙහෙර (රාජ රාජ පෙරුම්පල්ලි) මෙම ආයතනය පිහිටි ස්ථානය හැටියට සැලකීමේ වරදක් නැත. මෙහි තිබෙන 11 වැනි සිය වසට අයත් සෙල් ලිපියක වෙල්ගම් වෙහෙර නාමය සඳහන් වී තිබීම ද සැලකිය යුත්තකි.[21]

## 04. මහා නෙත්තප්පසාද මූලායතනය (මානෙත්පාමූල)

මහනෙත් පා හා වහදු (වාදු) මූළ පිළිබඳ ව දැක්වීමේ දී මහාචාර්ය ගුණවර්ධන සඳහන් කරන්නේ උත්තරමූලය හා කපාරාමූලය යන දෙක මූල තත්වයට පැමිණ තිබිය දී වහදු හා මහනෙත්පා ආවාස වශයෙන් පැවැති බවත්, පසු කාලයේ ප්‍රමුඛත්වයට පැමිණි මේ ආවාස දෙක මූල තත්වයට පත් වූ බවත් ය. ඒ සඳහා සාක්ෂ්‍ය වශයෙන් දක්වන්නේ පස්වන කසුප් රජුගේ අභයගිරි ලිපියේ සඳහන් "මහනෙත්පා වහදු දෙ අවසට්ද් මේ සිරිත් කරනු ඉසා" යන පාඨය යි. එහෙත් අනුරාධපුර යුගයෙන් පසු කාලය වන විට කපාරා හා වහදු මූල ගැන අසන්නට නැතත් මහනෙත්පා හා උත්තර මූල පිළිබඳව අසන්නට ලැබේ.[22]

මහනෙත්පාමූලය බගිනක දෙනානක පසට අයත් ධම්මරුචික භික්ෂූන්ගේ ආයතනය යි. පස්වන අග්බෝධි රජු (ක්‍රි.ව. 698-704) විසින් කර වූවකි. පස්වන කසුප් මෙකී මූලයෙහි නඩත්තුව සඳහා ගම්බිම් පුද ඇති අතර පාලනය සඳහා ව්‍යවස්ථා ද පනවා තිබේ. "මහනෙත් හා මිහිඳු දෙවසටද් මෙසිරිත් කරුණු දක්වා රජු පැන වූ ව්‍යවස්ථාවන්හි අදළ පායයි" මෙහි දක්වා තිබේ.[23] පූජාවලියෙහි කර්තෘ මයූරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමියන්ගේ ආචාර්යවරයා වූ සුමංගල හිමි ආයතනාධිපති වූ අතර **අභිධර්ම විභාවිනී ටීකාව** උන් වහන්සේගේ විශිෂ්ට කෘතියකි. එමෙන් ම **නිකාය සංග්‍රහයේ** දක්වන ලද තොරතුරුවලට අනුව ශාරිපුත්‍ර සංඝරක්ඛිත සුමංගල, වාගීශ්වර ධර්මකීර්තී නාගසේන, ආනන්ද වේදේහ, බුද්ධප්‍රිය, අනවමදර්ශී යන යතිවරුන් මෙම මූලයේ වැඩවාසය කරමින් පර්යාප්ති ශාසනය බැබළ වීම සිදු කරන ලදි. එමෙන් ම වානවාසී නිකායික යතිවරයෙකු වූ මහා මෛත්‍රී තෙරුන්ගේ ආධිපත්‍ය කාලයේ විශ්වකීර්තියට පත් ආයතනයක් ලෙස ප්‍රසිද්ධියට පත් විය. උන් වහන්සේට පෙර රම්මුගොඩ දීපංකර ස්වාමීන් වහන්සේ, ආචාර් සොළී මහතෙරුන් වහන්සේ ආධිපත්‍ය දරා තිබේ.

**ලෝවැඩ සඟරාව, කව් ලකුණු මිණිමල, බුදුගුණ අලංකාරය, හා දහම්ගැට මාලාව** කළ වීදගම මෛත්‍රී මාහිමියන් ද මෙම මූලයේ වැඩ වාසය කොට තිබේ.[24] මෙහි දක්නට ලැබෙන ඓතිහාසික තොරතුරු අනුව මහනෙත්පාමූලයේ වැඩ සිටි මෙම මහ සඟන ශාසනික වූත් ශාස්ත්‍රීය වූත් විශිෂ්ට සමාජ මෙහෙවරක් ඉටු කොට ඇති බව දැකගත හැකි වේ.

## 05. දක්ඛිණ මූලායතනය (දකුණුමූල)

දක්ඛිණ මූලායතනය සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ඉතා පැරණි ම මූලායතනයක් වශයෙන් හඳුනාගත හැකි ය. වළගම්බා රජුගේ ඇමතියකු වූ උත්තිය විසින් අනුරාධපුර නගරයේ දකුණු දෙසින් දක්ඛිණ නමින් විහාරයක් ඉදි කළ බව **මහාවංසයේ** තොරතුරු සඳහන් වේ. "ඒ සත් යෝධයන් අතුරෙන් උත්තිය නම් තැනැත්තේ නුවරට දකුණු දිගින් දක්ෂිණ නම් විහාරයක් කරවීය. මූලාව තෙමේ ද එහි ම විහාරයක් කර වී ය. මූල නම් ඇමති වූ තෙමේ ද විහාරයක් කර වී ය."[25] මෙම ආයතනය ධර්මරුචික නිකායෙන් වෙන් ව ගිය සාගලිය භික්ෂූන් වහන්සේ

පිරිසක් වැඩ සිටි බව දක්නට ලැබේ. එම පිරිස අභයගිරි පාර්ශ්වයට අයත් පිරිසකි. එමෙන් ම මෙහි සංවර්ධන කටයුතු කණිෂ්ඨ තිස්ස රජු (ක්‍රි.ව. 160-180) සිදු කොට තිබේ. එහි විහාර ස්තූපය සඳහා කඤ්චුකය ද, ආයතනයට යාම් ඒම් සඳහා මාර්ගය ද, ආරක්ෂක පවුර ද, ඉදි කොට තිබේ.[26] භික්ෂූන් වහන්සේලා සිය ගණන් වැඩ වාසය කළ නමුත් මෙහි ආයතනාධිපති ධූරය දැරූ යතිවරුන්ගේ නම් සඳහන් නො වේ. කෙසේ වෙතත් මෙහි වාසය කළ භික්ෂූන් වහන්සේලා ශාස්ත්‍රාලෝකය නැංවීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කොට තිබේ.

## 06. කප්පුර මූලායතනය (කපුරුමූල)

අභගිරි විහාරයේ කුට්ටම් පොකුණට උතුරින් වූ සංඝාරාමයේ තිබී හමු වූ සංඝනන්දි තෙරුන්ගේ සංස්කෘත ශිලාලිපිය අනුව කපාරාමූලය එම භූමියේ පිහිටි බව තහවුරු කොටගෙන ඇත. කුට්ටම් පොකුණ කපාරාමූල භික්ෂූන්ට පැන් පහසුව සැපයූ පොකුණකි. ඉන් උතුරේ වූ සංඝාරාමය අභයගිරි විහාරයේ අනිකුත් මූලවල පිහිටි පිරිවෙන්වලට වඩා බොහෝ සෙයින් වෙනස් ස්වරූපයක් දරයි. **පූජාවලියට** අනුව කුඩා කපාරා මහ කපාරා යනුවෙන් එහි කොටස් දෙකක් තිබූ බව සඳහන් වෙතත් කිසි ම මූලාශ්‍රයක විස්තර සඳහන් නැත. සමහර විට එය කපාරාමූලයේ ව්‍යප්ත වීමක් සේ සැලකිය හැකි ය.[27] කප්පර මූළයේ ආරම්භය දෙවෙනි දඨෝපතිස්ස රජුගේ (ක්‍රි.ව.659-667) කාලයට අයත් වේ. එම කප්පූර පිරිවෙණ කරවා අභයගිරියට පූජාකර ඇති බව **මහාවංසයේ** සඳහන් වේ. “හේ තෙමේ අභයගිරි විහාරයෙහි කපුරු පිරිවෙණ කරවීය. නිපුතුල් නම් විහාරය කරවා ඒ වෙහෙරට දෙවීය."[28] පස්වන කාශ්‍යප රජුගේ (ක්‍රි.ව. 914-923) අභයගිරි ලිපියේ ද කපාරාමූලයේ පාලනය සම්බන්ධ ව නීති රීති සඳහන් වෙයි. මෙම ලිපියෙහි මහාකපාරා පිරිවෙන් ලද්දන් හා මෙහෙ කරුවන් සම්බන්ධ වැටුප් නියම කොට ව්‍යවස්ථා පනවා තිබේ.[29] මෙම තොරතුරු මගින් පැහැදිලි වන්නේ මේ අවධිය වන විට කපාරාමූල ආයතනය ඉතා විශාල මෙන් ම දියුණු මට්ටමක පැවැති බව යි. මෙහි වැඩ වාසය කළ මූලායතනාධිපති මහ තෙරුන් වෙනුවෙන් මහ පැරකුම්බා රජු විසින් පොළොන්නරුවේ පහයක් කරවා පූජා කළ බව සඳහන් වේ. උතුරුමූලය, වහදූමූලය, මහනෙත්පාමූලය, මෙන් ම කපාරාමූලය ද අභයගිරි පාර්ශ්වයට අයත් දසවන හා එකොළොස්වන සියවසේ රාජ්‍ය කළ රජවරුන්ගේ රාජ්‍ය අනුග්‍රහය නොමඳ ව ලද ආයතන බව ඓතිහාසික තොරතුරු මගින් අනාවරණය වේ.

## 07. සෙනාපති මූලායතනය (සෙනරත්මූල)

සේනාපති මූලායතනය සිව්වන අග්බෝ රජුගේ (ක්‍රි.ව 667-683) කාලයේ ඔහුගේ අමාත්‍යවරයෙකු වූ පොත්ථකුට්ට විසින් ජේතවනාරාමයෙහි කරවන ලද බව මහාවංසයේ සඳහන් වේ.[30] ඒ අනුව මෙම සේනාපති මූලායතනය ජේතවන ගුරු කුලයට අයත් ව පැවැති ආයතනයක් ලෙස හඳුනාගත හැකි ය. පස්වන පැරකුම් රජු විසින් මෙම මූලයෙහි අධිපති හිමියන්ට අනාගත පරපුරේ හිමිවරුන්ට ද දිවිගොඩ කුඹුර නඩත්තුව සඳහා පූජා කර ඇත. හතරවැනි මිහිඳු රජුගේ (ක්‍රි.ව 948-964)

ජේතවන ලිපියේ "සෙව්රද්මුලැ වුවන සඟ් මහලු විසින් මෙදෙරටු පැන් මඩියෙහි උඩුමහල් යටිමහල්හිද් පැන් කළ තබන භාරයෙහිද් කිසි කවුරු පරියායෙකිනුද් නවාතැන් නොදෙනු ඉසා."[31] මුල් යුගවල දී මෙම ආයතනය සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වුවත් කෝට්ටේ රාජ්‍ය යුගයෙන් පසු මෙම මූලායතනය සම්බන්ධයෙන් තොරතුරු සඳහන් නො වේ.

## 08. වාහදීපක මූලායතනය (වාදුම්මූල)

වහදු මූලය නමින් හැඳින්වෙන මෙම ආයතනයේ නාමය සම්බන්ධයෙන් විවිධ මත පවතී. ඒ අනුව ටී.ජී කුලතුංග සඳහන් කරනුයේ වහදු, වාදු යන්නෙහි අර්ථය නිසැක වශයෙන් ම දැක්විය නො හැකි බව යි. පාලියට පෙරළීමේ දී මෙය වහදීප යනුවෙන් දක්වා ඇතත් පෙර කී පරිදි අප විසින් සැලකිල්ල දැක්විය යුත්තේ එහි සිංහල වචනය පිළිබඳ ව ය. බෝධිවංස ගැටපදකරු පැරණි ස්ථානයන්හි පිහිටීම විස්තර කිරීමේ දී සමකාලීන ව ප්‍රසිද්ධියට පත් ව තිබූ ස්ථාන ආශ්‍රය කොට ගෙන දිශාව දක්වා තිබීමෙන් අභයගිරි භූමියේ වාදුව යනුවෙන් හඳුන්වා ඇත්තේ වෙන කිසිවක් නො ව සුප්‍රසිද්ධ වහදු මූලය බවට එය ප්‍රබල සාක්ෂ්‍යයක් වේ. භූමියක් වශයෙන් ගත් කල්හි ස්තූපයෙන් උතුරු ප්‍රදේශය පෙරිමියන්කුලම වැව පැරණි ගාමිණිවාපි පාමුල වූ පහත් බිමක් බව පෙනේ. වාදුව වූයේ ඒ නිසාද යි සෙවි යුතු බව එතුමන් සඳහන් කොට තිබේ.[32]

වහදු මූලායතනයේ නිර්මාතෘවරයා වශයෙන් සලකනු ලබන්නේ මහලැපාණා නමින් ප්‍රසිද්ධ මානවම්ම රජු ය. (ක්‍රි.ව. 689-698) **මහාවංසයට** අනුව මෙම නිර්මාතෘ ගැන වාර්තා නොවෙතත් හතරවන අග්‍රබෝධි විසින් වාහදීපක ප්‍රාසාදය පිළිසකර කර වූ බව සඳහන් වේ.[33] එමෙන් ම වහදු මූලයේ සංවර්ධනය සඳහා තුන්වන දප්පුල (ක්‍රි.ව. 912-913) පස්වන කාශ්‍යප (ක්‍රි.ව. 902-912) යන රජවරුන් අනුග්‍රහය දක්වා තිබේ.

මෙහි දක්නට ලැබෙන ඓතිහාසික තොරතුරුවලට අනුව අෂ්ටමූලායතන යනු මුලින් ඇති වූ පිරිවෙන් ආයතයන්හි ම වඩා දියුණු මට්ටමකට සංවර්ධනය වූ අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි ය. ඒ අනුව මහා විහාරයෙන් ඇරඹි ථෙරවාදී අධ්‍යාපන අයතනය පිරිස වැඩිවෙත් ම යම් යම් අර්බුදකාරී තත්වයන් ද පදනම් කොට ගනිමින් අභයගිරිය හා ජේතවන අධ්‍යාපන ආයතන කෝට්ටේ යුගය දක්වා ම සංවර්ධනය වූ ආකාරයක් දැක ගත හැකි ය. එවකට මෙම ආයතන විද්‍යාපීඨ මට්ටමේ උසස් තත්වයට පවත්වාගෙන ගොස් තිබේ. විශේෂයෙන් ත්‍රිපිටක භාණකවරුන් මෙන් ම අටුවාකරණයෙහි දක්ෂ යතිවරුන් මෙම අධ්‍යාපන ආයතවල බිහි වීම සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගත හැකි ය. මෙම අෂ්ට මූලායතනවලින් මෙරට අධ්‍යාපන ක්ෂේත්‍රයට සිදු වූ සේවාව අපරිමිත ය. විශේෂයෙන් අතීතයේ එවැනි ආයතනවල අධ්‍යාපනය හදාළ යතිවරයාණන් වහන්සේලා විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයන් අදටත් විරාජමානව පවතින අතර එමගින් නූතන බුද්ධිමතුන් මෙන් ම විද්‍යාර්ථීන් ද තම දැනුම සංවර්ධන කර ගැනීම සිදු කරනු ලබයි.

## ආන්තික සටහන්

1 ධම්මකිත්ති හිමි ඩී, **සම්බුද්ධ දේශන විලාසය**, සරස්වතී ප්‍රකාශනය, දිවුලපිටිය: 2006, පි. 37-38.

2 **මජ්ඣිම නිකාය**, බු.ජ.මු, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල: 2005, පි. 512.

3 විජිතනන්ද හිමි කැලිගම, **පිරිවෙන් අධ්‍යාපනය හෙවත් සම්භාව්‍ය දේශීය අධ්‍යාපනය**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2003, පි.31-32.

4 සුරවීර, ඒ.වී, **අනුරාධපුර සංස්කෘතිය**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2010, පි. 31.

5 එම, පි.32.

6 විජිතනන්ද හිමි කැලිගම, **පිරිවෙන් අධ්‍යාපනය හෙවත් සම්භාව්‍ය දේශීය අධ්‍යාපනය**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2003, පි.42.

7 එම, පි. 43.

8 කුලතුංග ටී.ජී, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ 07: 2014, පි.181.

9 අදිකාරි අබයරත්න, **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ: 2002, පි.58.

10 සන්නස්ගල පුඤ්ඤිබණ්ඩා, **සිංහල සාහිත්‍ය වංශය**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2013, පි. 36-37-38.

11 අදිකාරි අබයරත්න, **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන** I පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ: 2002I පි. 59.

12 අබේසිංහ වික්‍රමනායක, **පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩ: 1999, පි. 44.

13 **මහාවංසය**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල: 1986, පි. 202.

14 අදිකාරි අබයරත්න, **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ: 2002, පි.60.

15 දුනුවිල චන්ද්‍ර, **අනුරාධපුර යුගයේ අධ්‍යාපන පද්ධතිය**, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ: 2013, පි. 201.

16 කුලතුංග ටී.ජී, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ 07: 2014, පි.187.

17 එම, පි.187.

18 අධිකාරි අබයරත්න, **සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2002, පි.17.

19 එම, පි.19.

20 අදිකාරි අබයරත්න, **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ: 2002, පි.60.

21 අබේසිංහ වික්‍රමනායක, **පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩ: 1999, පි. 46.

22 කුලතුංග ටී.ජී, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ 07: 2014, පි.199.

23 අධිකාරි අබයරත්න, **සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටිය: 2002, පි.20.

24 අදිකාරි අබයරත්න, **ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා මහ සඟන**, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, නුගේගොඩ: 2002, පි.66-67.

25 **මහාවංසය**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල: 1986, පි. 202.

26 අධිකාරි අබයරත්න, **සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති**, චතුර මුද්‍රණාලය,

වැල්ලම්පිටියඃ 2002, පි.22.

27 කුලතුංග ටී.ජී, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ 07ඃ 2014, පි.200.

28 **මහාවංසය**, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවලඃ 1986, පි. 201.

29 අබේසිංහ වික්‍රමනායක, පැරණි ශ්‍රී ලංකාවේ ආරාම අධ්‍යාපනය, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්, නුගේගොඩඃ 1999, පි. 45.

30 මහාවංසය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවලඃ 1986, පි. 202.

31 අධිකාරි අබයරත්න, **සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටියඃ 2002, පි.24.

32 කුලතුංග ටී.ජී, **පුරාණ අභයගිරි විහාරය**, මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය, කොළඹ 07ඃ 2014, පි. 199.

33 අධිකාරි අබයරත්න, **සම්භාව්‍ය භික්ෂු අධ්‍යාපනය හා අධ්‍යාපන නීති**, චතුර මුද්‍රණාලය, වැල්ලම්පිටියඃ 2002, පි.25.